

# මව්බිම මුහුණපා ඇති අනතුර හඳුනා ගනිමු

අපගේ ආදරණීය මාතෘ භූමිය බෙදා වෙන්කොට දෙමළ ඊලාම් රාජ්‍යයක් බිහි කිරීම සඳහා දශක 2කට වැඩි කාලයක් තිස්සේ ත්‍රස්තවාදී යුද්ධයක් පවත්වා ගෙන ගිය කොටි සංවිධානය, යුදමය වශයෙන් තීරණාත්මක ලෙස පරාජය කිරීමට මෙරට ආරක්ෂක හමුදා මේ වනවිට සමත් වී තිබේ. කොටි ත්‍රස්තවාදය ලැබූ මේ පරාජය මෙරට දේශප්‍රේමී ප්‍රගතිශීලි සියළු ජනයාගේ ඉමහත් සතුටට හේතුවී තිබේ. පසුගිය ඉතිහාසය පුරාම බෙදුම්වාදය පෝෂණය වීමේ දෙසට තබන ලද හැම ප්‍රයත්නයක්ම පරාජය කොට කොටි සංවිධානය පරාජය කිරීමේ තැනට මේ රට ගෙන ආ ජනතා විමුක්ති පෙරමුණේ අපි ද ඒ පිළිබඳව වඩාත් සතුටු වෙමු. එහෙත් කොටි ත්‍රස්තවාදය යුදමය වශයෙන් පරාජය කිරීම පිළිබඳව ජනතාවගේ හදවත් තුළ ඇති සතුට සිය බලය තහවුරු කර ගැනීමට උපයෝ-ගීකර ගනිමින් කඩින් කඩ මැතිවරණ පවත්වන වත්මන් ආණ්ඩුව රට ඉදිරියේ ඇති සැබෑ අනතුර ජනතාවගෙන් වසංකිරීමට කටයුතු කරමින් සිටී. යුදමය ජයග්‍රහන වෙත ජනතා අවධානය යොමු කොට ඊට මුවාවී වත්මන් ආණ්ඩුව ගෙන යන ජනතා විරෝධී හා හානිකර කටයුතු පරාජය කිරීම සඳහා ඒවා නිවැරදිව හඳුනාගත යුතු යැයි අපි සිතමු.

පසුගිය පලාත් සභා මැතිවරණවලදී ආණ්ඩුව ජනතාවගෙන් ඡන්ද ඉල්ලුවේ කොටි පරදන සටන අවසන් කිරීම සඳහා තම ආණ්ඩුව ශක්තිමත් කරන ලෙස පවසමිනි. කොටි පැරදවීම සඳහා අලුතින් ජනවරමක් හෝ ශක්තියක් අවැසි නැති වුවත් මෙරට ජනතාව ආණ්ඩුවට පලාත් සභා ඡන්දවලදී විශාල බලයක් ලබා දෙන ලදී. එහෙත් එම ජනතා බලයෙන් ශක්තිමත් වූ ආණ්ඩුව එම ශක්තිය පාවිච්චි කළේ කොටි පැරදවීමට ද? නැත. වයඹ පලාත් සභා ඡන්ද අවසන් වූ වහාම ඉන් ලද දැවැන්ත බලය උපයෝගී කරගනිමින් ආණ්ඩුව කළේ ජනතාවගේ ජලගාස්තු විශාල ප්‍රමාණයකින් ඉහළ දැමීමය. දුරකථන සඳහා අමතර බද්දක් පැනවීමය. ඊටත් වඩා බරපතල කරුණ වූයේ පසුගිය වසර ගණනාවක් තිස්සේ ජනතා විමුක්ති පෙරමුණ මැදිහත්ව සම්මත කිරීමට ඉඩ නොදුන් විදුලිබල මණ්ඩලය පෞද්ගලිකකරණය කිරීමේ පනත පසුගිය මාර්තු 03 දා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සම්මත කර ගැනීමය. පසුගිය එක්සත්

ජාතික පක්ෂ ආණ්ඩුව සමයේ දී පවා සම්මත කිරීමට ඉඩ නොදුන් මෙම පනත වත්මන් ආණ්ඩුව විසින් කඩිමුඩියේ සම්මත කරගනු ලැබූයේ මැතිවරණයෙන් ලද අසීමිත බලයේ ශක්තිය උපයෝගී කරගනිමින් බව පැහැදිලිය. විදුලි බලමණ්ඩලය විකිණීමේ පනත සම්මතවීමේ හානිකර ප්‍රතිඵල තව මාස කිහිපයකින් ජනතාවට දැනෙනු ඇත. එහෙත් දැනටමත් පනත සම්මත වී ඇති බැවින් අනාගතයේ පසුතැවිලි වීම හැර අන් දෙයක් ජනතාවට ඉතිරි නොවනු ඇත. ආණ්ඩුවේ අරමුණ පිළිබඳව ජනතාව අවධියෙන් හා අවබෝධයෙන් සිටිය යුත්තේ ඒ නිසාය.

මේ වනවිට ශ්‍රී ලංකාව ඉතාම බරපතල ආර්ථික අර්බුදයකට මුහුණ දී ඇත. මෙම අර්බුදය ජය ගැනීම තබා එය නිවැරදිව හඳුනාගැනීමටවත්

**කොටි පරදන යුද්ධය ජයග්‍රාහී ලෙස ඉදිරියට යද්දීම පසුගිය කාලය පුරාම ලංකාවට බලපෑම් කළ ඉන්දියාවේ, එක්සත් ජනපදයේ, යුරෝපයේ, එක්සත් ජාතීන්ගේ නිලධාරීන්ගේ බලපෑමට ආණ්ඩුව යටවී ඇති බව පෙනේ. ආණුඩව මෙහිදී අනුගමනය කරන්නේ දෙබිඩි ප්‍රතිපත්තියකි. මැතිවරණ දිනා ගැනීම සඳහා මැතිවරණ වේදිකාවේ දේශප්‍රේමය හා යුද්ධයේ ජයග්‍රහණ අලෙවිකරණ' ආණ්ඩුව ජාත්‍යන්තර ප්‍රජාව හා බෙදුම්වාදීන් හමුවේ ඔවුන් සතුටු කිරීමට බලය බෙදීමේ කටයුතු අරඹා ඇත. ආණ්ඩුව බලය බෙදීමට ස්ථිරවම පියවර ගන්නා බවට ශාක්ෂි රැසක්ම තිබේ.**

වත්මන් ආණ්ඩුව සමත් වී නැත. පසුගිය කාලයේ මුදල් අමාත්‍යාංශය හා මහබැංකු ප්‍රධානීන් කළ ප්‍රකාශවලින් එය පැහැදිලි ය. එහෙත් අද වනවිට අපේ රටේ අපනයන නිෂ්පාදන කර්මාන්ත හා මූල්‍ය ආයතන බිඳවැටෙමින් බරපතල අර්බුදයක් නිර්මාණය කර ඇත.

පසුගිය 2008 වසර අගදී ලංකාවේ තේ කර්මාන්තය කඩා වැටුණ අතර තේ කර්මාන්තයෙන් ජීවත්වන පවුල් ලක්ෂ 35ක අදායම් අහිමි කිරීමටත් ලංකාවට ලැබෙන විදේශ විනිමය අඩුවීමටත් එය හේතු විය. ඊලග'ට රබර්, කුරුඳු යන වැවිලි භෝග කඩා වැටුණු අතර මැණික් කර්මානත්ය ද කඩා වැටුණි. මූල්‍ය සමාගම් බංකොලොත් වීම සක්විතිගේ හොර බැංකුවේ සිට සෙලාන් සමූහය දක්වා පැතිරිනි. සෙලාන් සමූහයේ සේවය කළ 30දහසක් පමණ වන සේවකයන්ගෙන් අති බහුතරයකට රැකියා අහිමි වෙමින් පවතී. ඊට අයත් ගෝල්ඩන් කී ආයතනයේ පමණක් සේවකයන් 1700කට රැකියා අහිමි විය. එසේම රටපුරා ඇග'ලුම් ඇතුළු නිෂ්පාදන ආයතන, කර්මාන්ත ශාලා රැසක් වසා දමා ඇති අතර සමහරක් තම නිෂ්පාදන අඩුකර සේවකයන් අඩු කරමින් සිටී. ගෙවී ගිය මාස 3ක පමණ කාලය තුළ පෞද්ගලික අංශයේ සේවකයන් 50000ක් පමණ රැකියාවලින් ඉවත් කර තිබේ. නිෂ්පාදන ආයතන කම්හල් හා මූල්‍ය ආයතන කඩා වැටීම තව තවත් සිදුවන අතර ඒවා නැවැත්වීමට ප්‍රමාණවත් පියවර ගැනීමට තවමත් ආණ්ඩුව අසමත්ව සිටී.

පොදුවේ ලෝකය පුරාම මෙන්ම අපේ රටතුළද හමා යන මේ බියකරු ආර්ථික කුණාටුව විසින් මේ වනවිටත් අපේ රටේ ආර්ථිකයට බරපතල හානි සිදුකර තිබේ.

ලංකාවේ අපනයන භෝග, අපනයන කර්මාන්ත හා මූල්‍ය සමාගම් බිඳවැටීම ආකාර කිහිපයකින් රටේ ආර්ථිකයට බලපා ඇත. එක් අතකින් ජනතාවගේ ආදායම් අඩුවී ඇති අතර එය දේශීය වෙළඳපොලේ ක්‍රියාකාරීත්වයට නරක ලෙස බලපා ඇත. එහි ප්‍රතිඵලය වී ඇත්තේ දේශීය වෙළඳපොල සඳහා භාණ්ඩ හා සේවා නිපදවන කුඩා නිෂ්පාදකයා ද අර්බුදයට යාමය.

අනෙක් අතට මෙය රජයේ ආදායම් අඩුකර ඇති අතර විදේශ විනිමය සංචිතය ද බරපතල ලෙස අඩුකර තිබේ. 2009 මාර්තු මස මහ බැංකුව නිකුත් කර ඇති වාර්තාවකට අනුව පසුගිය 2008 වසර සඳහා ආණ්ඩුව බලාපොරොත්තු වූ බදු ආදායම්වලින් රු බිලියන 110ක මුදලක් ආණ්ඩුවට ලබාගැනීමට නොහැකි වී ඇත. එසේම ලංකාවේ විදේශ විනිමය සංචිතය ද බලපතල ලෙස පහත වැටී තිබේ. 2008 සැප්තැම්බරයේ දී ඩොලර් බිලියන 3.4ක් වූ විදේශ විනිමය සංචිතය 2009 ජනවාරි වනවිට ඩොලර් බිලියන 1.4දක්වා බරපතල ලෙස අඩු වී තිබේ. මෙය ඉතාම නරක තත්ත්වයකි. මේ තත්ත්වය මතුවී තිබෙන්නේ ලෝක ආර්ථික අර්බුදය විසින්

වෙළඳපොල විකෘති කිරීම හේතුවෙන් ලෝක වෙළඳපොලේ තෙල් මිල විශාල වශයෙන් අඩුවී, නැව් ගාස්තු පවා අඩු වී තිබියදීත් ය.

මෙම අතිශය බරපතල ආර්ථික අර්බුදය හමුවේ නිෂ්පාදනවලට දිරි දෙමින් රජයේ නාස්තිකාර වියදම් අඩුකරමින්, ජාතික සම්පත් නිෂ්පාදනයට උපයෝගී කරගනිමින්, ජනතාවගේ ශක්තිය පෙළගස්වා ඊට මුහුණ දෙනවා වෙනුවට ආණ්ඩුව කරමින් සිටින්නේ කුමක් ද? මහජන මුදල් බරපතල ලෙස නාස්තිකරීමය. තෙල් මිලදී ගැනීම සඳහා විදේශ බැංකු දෙකක් සමග ආණ්ඩුව අත්සන් කළ හෙජින් ගිවිසුම නිසා ලංකාවට සිදුවූ පාඩුව රුː කෝටි 7700ක් පමණ වේ. මිහින් ලංකා ගුවන් සේවය බංකොලොත් වීමෙන් අහිමි වූ මුදල රුපියල් මිලියන 3200කි. මීට අමතරව ආණ්ඩුවේ ප්‍රධානීන් හා ඇමතිවරුන් විසින් කරන හොරකම් හා නාස්ති කිරීම් කෙළවරක් නැත. ලංකාවේ විදේශ ඇමතිවරයා පසුගිය වසර සඳහා විදේශ සංචාර වෙනුවෙන් පමණක් වැයකල මුදල රුපියල් කෝටි 85ක් බව වාර්තාවිය. ඒ නාස්තිකාර වියදම් පිළිබඳ එක්

නිදසුනක් පමණි. ඒ සියල්ල පවතින ආර්ථික අර්බුදය මතට එකතුවූ විට තත්ත්වය ඉතා බරපතල වීම වැළැක්විය නොහැක. මෙම දැවැන්ත ආර්ථික අර්බුදය හමුවේ ආණ්ඩුවට ඇති විසඳුම් මොනවා ද? ආණ්ඩුව දැනටමත් පෙන්වා ඇති පරිදි ඒ සඳහා ආණ්ඩුවට ඇත්තේ ක්‍රියාමාර්ග 3කි. ඒවා නම්,

1. ණය ගැනීම
2. රටේ සම්පත් විකුණා දැමීම
3. ජනතාව මත බර පැටවීමය

මේ වනවිටම විදේශ වත්කම් බිඳවැටීම විසින් මතුව ඇති අර්බුදය විසඳගැනීම සඳහා ආණ්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ඇමරිකානු ඩොලර් බිලියන 1.9ක ණය මුදලක් ගැනීමට තීරණය කර ඇති අතර ඒ සඳහා වන කොන්දේසි පිළිබඳ සාකච්ඡා අරඹා ඇත. පසුගිය මාර්තු 03 දා හදිසියේම ලංකා විදුලි බලමණ්ඩලය විකිණීමේ පනත සම්මත කරගනු ලැබුයේ ද, එම පනත සම්මත කරගත් විට ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබාදීමට එකග' වී ඇති ඩොලර් මිලියන 600ක මුදල ලබාගැනීම සඳහාය. එසේම වැඩි පොලියට මලයාසියාවෙන් කෙටි කාලීන ණය ගැනීමට ද ආණ්ඩුව උත්සාහ කරමින් සිටින බව වාර්තා විය. මෙහි ප්‍රතිඵලය වන්නේ කුමක් ද? රටේ ණය බර තව වටයකින් වැඩි වීමත් අපට ඉතාම අහිතකර ආර්ථික හා දේශපාලන කොන්දේසි වලට යටවීමට සිදුවීමත් ය. දැනටමත් අපේ රට ලබාගෙන ඇති ණය ප්‍රමාණය අති විශාලය. අප අලුතින් ණය ගැනීම මුළුමනින්ම නවතා දැමුවත් කලින් ගත් ණය ගෙවා අවසන් වන්නේ 2047 දීය.

1977න් පසු සෑම ආණ්ඩුවක්ම කළ පරිදි (සන්ධාන ආණ්ඩුවේ ජනතා විමුක්ති පෙරමුණ සිටි වසරක කාලය හැර) මේ ආණ්ඩුව ද ජාතික සම්පත් විකිණීම අරඹා ඇත මහින්ද චින්තන" වෙනුවට එක්සත් ජාතික පක්ෂයේ යළි පුබුදමු ශ්‍රී ලංකා" වැඩ සටහන රහසිගතව ක්‍රියාත්මක වෙමින් පවතී. විදුලි බලමණ්ඩල පනත සම්මත වන්නේ ඒ අනුවය. මේ වනවිට ලංකා හෝටල් සංස්ථාව

34 වන පිටුවට

ජනතා විමුක්ති පෙරමුණ,
ජාත්‍යන්තර අංශය,
ඕස්ට්‍රේලියාව

ශ්‍රී ලාංකික ඔබ වෙනුවෙන්ම

EMAIL, WEB HOSTING, WEB DESIGN, GRAPHICS & PRINTING..

- Email Hosting from $49/Year
- Web Hosting from $99/Year
- Web Sites from $199

Ready to use web applications for your Shop, Restaurent, Business

SATISFACTION 100% GUARANTEED

Derana Australia Pty Ltd

Contact : AJITH Call Us Now !!
MOB : 0430 169 036 Email: info@derana.com.au

http:://derana.com.au